# The concept of *Bodhisattva* in early Buddhist and Theravāda sources

## ආදි බෞද්ධ හා ථේරවාද මූලාශ්‍රය තුළ දැක්වෙන බෝධිසත්ව සංකල්පය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

### හැඳින්වීම

බෞද්ධ හීනයාන, මහායාන යන සම්ප්‍රදායයන් දෙකෙහිම දක්නට ලැබෙන සුවිශේෂී සංකල්පයක් ලෙස බෝධිසත්ත්ව සංකල්පය දැක්විය හැක. හීනයානයේ හෙවත් ථේරවාදී සම්ප්‍රදායේ නිකායගත ඉගැන්වීම් තුළින් ද නිකායාන්තර මතවාද තුළින් ද මෙම බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ කරුණු දැකවේ. මහායානයේ දී මහායාන සූත්‍ර සාහිත්‍යයෙන් ද, මහායාන අදහස් ඉදිරිපත් වන්නා වූ බෝධිචර්යාවතාරයෙන් ද මේ පිළිබඳ විස්තර දැකගත හැකිය. මෙම සම්ප්‍රදායයන් දෙකටම අනුව ''බෝධිසත්ත්ව'' සංකල්පය නොයෙක් අයුරින් විස්තර වේ.

පළමුව ''බෝධිසත්ත්ව'' යන පදයෙහි පදාර්ථ පිළිබඳ විමසා බැලීමේ දී ''බෝධි'' යන්න බුධ ධාතුවෙන් බෝධනාර්ථයෙහි ද, චතුසත්‍යාවබෝධයෙහි ද වැටේ. ප්‍රඥාව, බුද්ධිමහිමය ආදී වූ අභිජානනාර්ථයන් ද එයට ඇතුළත්ය. එයින් මාර්ගඥානාවබෝධ සංඛ්‍යාත බුද්ධත්ත්වයම "බෝධි" ශබ්දයේ මුඛ්‍යාර්ථය යි. එසේම ''සත්ත්ව'' යන්න තුළින් "බුද්ධත්ත්ව ප්‍රතිවේධයෙහි ආසක්ත පුරුෂ ශ්‍රේෂ්ඨයාණෝ" යන අදහස අර්ථවත් කරයි.[1] මෙසේ බෞද්ධ සාහිත්‍ය අනුව දාන සීලාදී බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කිරීමෙහිලා සමාසක්ත වූ සබ්බඤ්ඤුතඥානාවබෝධයම පරමාර්ථ කොටගත්තා වූ පරමාදර්ශිගුණ මූර්ති වූ බුද්ධාංකුරයාණෝ බෝධිසත්ත්ව වශයෙන් හඳුන්වා ඇත.

මීට අමතරව ථේරවාද ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රයන් පිළිබඳ විමසා බැලීමේ දී ද බෝධිසත්ත්ව සංකල්පය නොයෙක් අයුරින් විස්තර වී ඇත. පාලි අටුවාවල ''බෝධියා සත්තො බොධිසත්තො''[2] යනුවෙන් විස්තර වන බුද්ධත්වය උදෙසා ඇලුණා වූ යන අර්ථයම ''බොධෞ ඥානෙ සත්ත්වං අභිප්‍රායො අස්තීති බොධිසත්ත්වඃ''[3] වශයෙන් මහායාන බෝධිචරියාපඤ්චිකාවේ දක්වා ඇත. එසේම ථේරවාද පූර්ව ආචාර්යවරු ''ප්‍රාණී'', ''ඇලුණු'' යන අරුත් දෙක සිතෙහි තබාගෙන ''බොධිසත්ත'' ශබ්දය වැඩි දුරටත් විමංසනය කොට ඇති ආකාරය පපඤ්චසූදනියෙන් පැහැදිලි වේ.

*''බොධිසත්තසෙසව සතොති බුජ්ඣන සත්තසෙසව සම්මාසම්බොධිං අධිගන්තුං අරහ සත්තසෙසව සකො දීපංකරස්සහි භගවතො අභිනිහාර සිද්ධිතො පපභූති තථාගතො බොධියං සත්තො තස්මා බොධිසත්තොති වුච්චති''*[4]

ජාතක අටුවා ගැටපදයෙහි බොධිසත්ත්ව නම් කවරෙක්දැයි විස්තර කරනු ලබන්නේ ''චතුර්විධ මාර්ග ඥානය ද, සර්වඥතා ඥානය ද, බොධි නම් වේ. එහි ඇලුණු බැවින් ද බුදුන් කෙරෙන් ලත් විවරණ ඇති බැවින් ද ඒ තැනැත්තා බුජ්ඣනක සත්ත්ව යැයිද එහෙයින් බොධිසත්ත්ව නම් වේ''[5]

යනුවෙනි. මෙහි ''බොධි' ශබ්දයෙන් මාර්ග ඥානය සහ සර්වඥතා ඥානය රැගෙන ''සත්ත්ව'' ශබ්දයෙන් සත්ත, සත්භාව, සක්ත යන අදහස් ඉස්මතු කොට ඇති ආකාරය දක්නට ලැබේ.

මෙම කාරණාවන්ට අමතරව ''බෝධිසත්ත්ව'' සංකල්පය පිළිබඳ විද්වත් මත රාශියක් ද දක්නට ලැබේ. එහිදී බෝධිසත්ත්ව යන්නෙන් අදහස් කරන්නේ ''සම්බෝධිය සඳහා උත්සහවන්ත වන පුද්ගලයා ය'' යනුවෙන් රාධ ක්‍රිෂ්ණන් පඬිතුමා අදහස් දක්වා ඇත. එසේම ''ආධ්‍යාත්මික වශයෙන් උත්කෘෂ්ඨ තත්ත්වයේ පසුවන අතිමානුෂික දැනුම සහ විඥානයෙන් යුත් එනම් ප්‍රඥාවේ උච්ඡ තත්ත්වයට පැමිණි පුද්ගලයා බෝධිසත්ත්වයා ය. මෙහි අවසාන ප්‍රතිඵලය බුද්ධත්වය යි.''[6] යනුවෙන් බෂාම් තම අදහස් දක්වා ඇත. මේ පිළිබඳව රීස් ඩේවිඩ්ස් මහතා ප්‍රකාශ කරනු ලබන්නේ ''සත්‍යාවබෝධයට යොමුවන පුද්ගලයා බෝධිසත්ත්වයා ය'' යනුවෙනි. මෙම විද්වතුන්ට අමතරව ඊ.ජේ. තෝමස් මහතා ''බෝධිය සොයන පුද්ගලයා නැතහොත් බෝධියට යොමුවන පුද්ගලා බෝධිසත්ත්වයා'' යනුවෙන් ද, සුසුකි විසින් ''බුද්ධිමත් පුද්ගලයා බෝධිසත්ත්වයා'' යැයි ද, චාල්ස් එලියට් ''ඥානය සාරකොට සළකන්නා, බුද්ධත්වයට පත්වීමට වීර්යය වඩන්නා බෝධිසත්ත්වයා'' යැයි ද අදහස් දක්වා ඇත. මෙසේ බෝධිසත්ව සංකල්පය පිළිබඳ නොයෙකුත් අදහස් මතවාද පසුකාලීනව ඉදිරිපත් වී ඇත.

### පාලි සතරනිකායේ දක්නට ලැබෙන බෝධිසත්ත්ව අදහස

බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ විමර්ශනය කිරීමේ දී මහායාන බෝධිසත්ත්ව සංකල්පය ඉතා පැරණි බව බොහෝ දෙනාගේ අදහසයි. මහායාන බෝධිසත්ත්ව සංකල්පය ආරම්භ වී ඇත්තේ ක්‍රි.පූ. 02 වන සියවසේ දී පමණ ය.[7] නමුත් ථෙරවාදය පිළිබඳ විමසීමේ දී ථෙරවාදි බෝධිසත්ත්ව සංකල්පය මූලික සූත්‍ර දේශනා තුළ ද දක්නට ලැබේ. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය යන පාලි සතර නිකායයන් තුළ බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ කරුණු හමුවේ. නමුත් එහිදී බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ පූර්ණ විස්තරයක් දක්නට නොමැත. පාලි සතර නිකායේ නාම මාත්‍රව සඳහන් වී ඇති එම කරුණු පසුකාලීනව ථෙරවාදී බෝධිසත්ත්ව සංකල්පය සංවර්ධනය කිරීමේලා මහත් වූ රුකුලක් වී ඇත.

ථෙරවාද බෝධිසත්ත්ව සංකල්පය ප්‍රකට කරන පැරණිතම මූලාශ්‍රය වන්නේ බුදුරජාණන් වහන්සේගේම ශ්‍රී මුඛ දේශනාක් වන භයභේරව සූත්‍රය සහ ද්වෙධාවිතක්ක සූත්‍රය යි.[8] මෙම සූත්‍ර දේශනා තුළ බුදුරජාණන් වහන්සේ සම්මා සම්බෝධිය අවබෝධ කිරීමට පෙර බෝධිසත්ත්වයෙකු වශයෙන් කටයුතු කළ ආකාරය විස්තර කරයි. එසේම අරියපරියේසන සූත්‍රයේ ද මෙම කරුණම තවදුරටත් දක්නට ඇත. ***''අනභිසම්බුද්‍ධො බොධිසත්තස්සෙව සමානො''***[9] මෙසේ පාලි සතර නිකායේ බෝධිසත්ත්ව අදහස බොහෝ සෙයින් දක්වා ඇත්තේ බුදුරදුන්ගේ බුද්ධත්වයට පෙර අවස්ථා විස්තර කරලීම සඳහා ය. මීට අමතරව දීඝ නිකාය චක්කවත්තිසීහනාද සූත්‍රය තුළ මතු බුදුවන මෛත්‍රිය බුදුන් පිළිබඳව කතාකරන විට ද බෝධිසත්ත්ව නාමය ව්‍යවහාර කොට ඇති ආකාරය දක්නට ලැබේ.

සංයුක්ත නිකාය ගොතම සූත්‍රයේ දැක්වෙන ***''පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි''***[10] මෙම පාඨයෙන් ද විස්තර වී ඇත්තේ බුද්ධත්වයට පෙර බෝසත් අවදියේ දී බුදුරදුන්ට සිතුණා වූ කල්පනාවක් පිළිබඳව ය. එසේම අංගුත්තර නිකායේ දුක නිපාතයේ දැක්වෙන ***''තස්ස මය්හං භික්ඛවෙ අප්පමාදිගතා බොධි''***[11] යන සූත්‍ර

පාඨයෙන් බුදුරදුන් බෝධිසත්ත්වවරයෙකු ලෙස අප්‍රමාදීව කටයුතු කොට බුද්ධත්වයට පත් වූ ආකාරය විස්තර වේ. දීඝනිකාය මහාපදාන සූත්‍රයේ බෝධිසත්වවරු සත් දෙනෙකු පිළිබඳ දක්වයි. එනම් විපස්සි, සිඛී, වෙස්සභූ, කකුසන්ධ, කෝණාගමන, කස්සප, ගෞතම යන බෝධිසත්ත්වවරු ය. ***''විපස්සි බොධිසත්තො තුසිතාකායා චවන්ති''***[12] චක්කවත්තිසීහනාද සූත්‍රයේ අනාගතයේ බුදුවන්නේ මෛත්‍රිය බෝසතුන් බව දක්වා ඇත. මෙම බෝධිසත්වවරු කොපමණ කාලයක් බෝධිසත්වවරු යන ව්‍යවහාරයෙන් භාවිතා කරන්නේ දැයි සඳහන් වී නොමැති වුව ද ගෞතම බෝධිසත්ත්වයන්ට තුසිත දිව්‍යලොව ජන්මය ලබා සිටි කාලයේ සිටම බෝධිසත්ත්ව නාමය ව්‍යවහාර කොට ඇති ආකාරය දක්නට ලැබේ.[13]

මෙසේ පාලි සතර නිකායේ ඇතැම් සූත්‍ර දේශනා තුළ බොධිසත්ත සංකල්පය දක්නට ඇතත් එහිදී එම අදහස වැඩිදුර විස්තර වී නොමැති බව පෙනේ. නමුත් මූලික සූත්‍ර දේශනා තුළ සංකල්පයක් වශයෙන් හෝ දක්වා ඇති එම අදහස පසුකාලීන ථෙරවාදීන්ගේ සංවර්ධනයට මහත් වූ දායකත්වයක් ලබා දී ඇති බව සිතිය හැක.

**ථෙරවාද මූලාශ්‍රය තුළ බෝධිසත්ව අදහස මානුෂීය ලක්ෂණවලින් යුක්තව සංවර්ධනය කොට ඇති අයුරු**

පාලි සතර නිකායේ දක්නට ලැබෙන ථෙරවාදී බෝධිසත්ත්ව අදහස වඩාත් සංවර්ධනයකට ලක්වන්නේ ඛුද්දක නිකායට අයත් චරියාපිටක, බුද්ධ වංශ, ජාතක පාලි යන ග්‍රන්ථ තුළින් ය.[14] සතර නිකායේ නාම මාත්‍රව දැක්වූ බෝධිසත්ත්ව අදහස පිළිබඳ පුළුල් වූ විස්තරයක් මෙහිදී දක්නට ඇත. මෙම මූලාශ්‍රය ග්‍රන්ථයන් බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් දෙකක් පමණ ඉක්ම ගිය තැන රචනා වී ත්‍රිපිටකයට ඇතුළත්ව ඇති බැවින් මෙහි දැක්වෙන කරුණු මහායාන ආභාෂය ලබා පෝෂණය වූවා යැයි සිතිය නොහැක.[15]

කෙසේ වෙතත් මහායාන බෝධිසත්ත්ව සංකල්පය තුළ දක්නට ලැබෙන අතිමානුෂික බෝධිසත්ත්ව ගුණාංග ථෙරවාද ග්‍රන්ථ තුළින් දක්නට නොලැබේ. ථෙරවාදී මූලාශ්‍රවලදී බෝධිසත්වයෝ මානුෂීය ගුණාංගයන්ගෙන් යුක්ත වූ උත්තම පුරුෂයෙකු ලෙස විස්තර වේ. බුද්ධ වංශයේ සුමේධ කථා පුවතෙහි බුදුරදුන් බුද්ධාංකුරයෙකු ලෙස කටයුතු කළ ආකාරය විස්තර කරයි. එහිදී එතුමා දීපංකර බුදුන් දවස සුමේධ තාපසව බුද්ධත්වය සඳහා විවරණලැබූ ආකාරය සඳහන් වේ. දීපංකර බුදුරජාණන් වහන්සේ සුමේධ තාපස තෙමෙ දැක මෙසේ පවසා ඇත.

***''පස්සථ ඉමං තාපසං - ජටිලං උග්ගතාපනං***

***අපරිමෙය්‍ය ඉතො කප්පෙ - බුද්ධො ලොකෙ භවිස්සති''***[16]

''ජටාධර වූ, උග්‍ර වූ තපස් ඇති මේ තවුසා බලන්න. මෙයින් අප්‍රමේය වූ කල්පයෙහි මෙතෙමෙ ලොව බුදුවෙයි.''

බුද්ධත්වය සඳහා පෙරුම් පුරන්නා වූ බෝධිසත්ත්ව තෙමෙ ඒ සඳහා විවරණ ලැබීමේ ප්‍රණිධිය අභිනීහාරය හෙවත් ප්‍රාර්ථනාව ඉටු කරගැනීම සඳහා කරුණු 08ක් සම්පූර්ණ කළ යුතු බව සුමේධ කතාවේ දැක්වේ. එනම්,

*''මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති - හෙතු සත්ථාර දස්සනං*

*පබ්බජ්ජා ගුණ සම්පත්ති - අධිකාරො ච ඡන්දතා*

*අට්ඨධම්ම සමොධානා - අභිනීහාරො සමිජ්ඣති''*[17]

1. මනුෂ්‍යත්වයක් ලැබ සිටීම.
2. ලිඞ්ග සම්පත්තිය. (පුරුෂ බවින් යුකත් වීම ලෙස අටුවාව දක්වා තිබේ.)
3. අර්හත්වයට හේතු සම්පත් ඇති බව.
4. ජීවමාන ශාස්තෘන් වහන්සේ දැකීම.
5. පැවිදිව සිටීම.
6. අෂ්ඨසමාපත්ති ආදි වූ ගුණ සම්පත්තිය.
7. ජීවිත පරිත්‍යාග සංඛ්‍යාත අධිකාරය.
8. බුද්ධකාරක ධර්ම වැඩීමේ කැමැත්ත.

මෙම කරුණු පිළිබඳ විමසා බැලීමේ දී ථෙරවාදය තුළ සංවර්ධනය වන්නා වූ බෝධිසත්ව සංකල්පයෙන් මානුෂීය ලක්‍ෂණවලින් යුතු පුද්ගලයෙකු අර්ථවත් වන ආකාරය දක්නට ඇත. මෙම කරුණු අට සම්පූර්ණය වන්නා වූ බෝධිසත්ව තෙමෙ බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීමට සුදුසු වන අතර එහිදී ද ඔහු තවදුරටත් ප්‍රණිධි 03ක් හෙවත් ප්‍රාර්ථනා 03ක් සම්පූර්ණ කළ යුතු වේ.[18]

1. මනෝ ප්‍රණිධාන
2. වාග් ප්‍රණිධාන
3. කාය ප්‍රණිධාන

මෙහි මනෝ ප්‍රණිධාන යනු බෝසත් තෙමෙ බුද්ධත්වය ලබාගැනීම සඳහා ස්ව සිතින් ප්‍රාර්ථනා කිරීම යි. වාග් ප්‍රණිධාන යනු බෝසතුන් අධිෂ්ඨාන පූර්වකව සසර බොහෝ කලක් සිතින් බුදුබව ප්‍රාර්ථනා කොට අනතුරුව වචනයෙන් එය ප්‍රාර්ථනා කිරීම යි. කාය ප්‍රණිධාන යනු එවැනිම කාලයක් බුද්ධත්වය සඳහා කායික ක්‍රියාවන්ට සිත යොමු කොට බුදුබව ප්‍රාර්ථනා කිරීම යි. මෙම ත්‍රිවිධ ප්‍රණිධාන සහ මූලික සුදුසුකම් අටෙන් සමන්විත වූ බෝධිසත්ව තෙම බුදු කෙනෙකුන් හමුවේ ජීවිත පරිත්‍යාග කොට නියත විවරණ ලැබීමට සුදුසු වන්නේ ය. සුමේධ තාපස තෙමේ ද දීපංකර පාද මූලයේ දී මතු බුදුවන බවත්, මේ මේ නම් ගොත් සහිත වන බවත්, මේ මේ නම් ඇති අය මව්පියන් වන බවත්, මේ මේ අය අග්‍ර ශ්‍රාවක ශ්‍රාවිකා වශයෙන් හැඳින්වෙන බවත් ආදි වශයෙන් නියත විවරණ ලැබූ ආකාරය ද එහිදී බොහෝ දෙවි මිනිසුන් ප්‍රමෝදයට පත් වූ ආකාරය ද බුද්ධ වංශයේ විස්තර කොට ඇත.

*''ඉදං සුත්වාන වචනං - අසමස්ස මහෙසිනො*

*අමොදිතා නරමරූ - බුද්ධබීජංකුරො අයං''*[19]

මෙසේ නියත විවරණ ලැබීමෙන් පසු බෝසතුන් යළි නූපදින භවයන් පිළිබඳව ද ථෙරවාද මූලාශ්‍රවල විස්තර කරයි. එනම් උන්වහන්සේ ජාත්‍යන්ධව නූපදියි. වටුවෙකුට වඩා කුඩාවට ද ඇතෙකුට වඩා මහත්ව ද නූපදියි. ප්‍රේත ආත්මවල කාලකඤ්ජක අසුර භවයෙහි ලෝකාන්තරික සහ අවීචි ආදි නිරයවල ද අසංඥ සුද්ධවාස වල ද අරූප ලෝකයෙහි ද මාර ලෝකයෙහි ද නූපදියි. එසේම උන්වහන්සේ නෙක්කම්ම, පව්වෙක, අලෝභ, අදෝස, අමෝහ, නිස්සරණ යන ආධ්‍යාසයන්ගෙන් ද සමන්විත වේ.[20]

නියත විවරණ ලැබීමෙන් අනතුරුව බෝසතුන් යොමුවන්නේ සුවිශේෂී වූ ප්‍රතිපදා මාර්ගය සම්පූර්ණ කිරීම උදෙසා ය. එනම් දස පාරමිතාවන් ය. මෙහිදී බෝධිසත්ත්වයන් ''බුද්ධාංකුර'' යන නාමයෙන් සළකනු ලබයි. එසේම මෙම බුද්ධකාරක ධර්මයන්ට ප්‍රත්‍ය වී බුද්ධත්වයට යොමු කරන භූමි සතරක් පිළිබඳව ද ථෙරවාද මූලාශ්‍රය තුළ දක්නට ලැබේ. එනම්,

1. උස්සාහ - බෝධි සම්භාර කිරීමට අවශ්‍ය දැඩි වීර්යය
2. උම්මග්ග - මැනවින් උපදවාගත් උපාය ඥානය
3. අවත්ථාන - මුහුකුරවාගත් දැඩි අධිෂ්ඨානය
4. හිතචරියා - සකල සත්ත්වයන් විෂයෙහි පතල මෛත්‍රිය සහ කරුණාව

මෙසේ සතර බුද්ධ භූමිවල පිහිටා පාරමී පුරන්නා වූ බෝසතුන් පාරමී පුරන කාලය පිළිබඳව ද ථෙරවාදී මූලාශ්‍රයන් තුළ සඳහන් වේ. ඒ අනුව ප්‍රඥාධික බෝධිසත්ත්වරයෙකු සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද, ශ්‍රද්ධාධික බෝධිසත්ත්වවරයෙකු අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද, වීර්යාධික බෝධිසත්ත්වවරයෙකු සොළොස් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කළ යුතු බව සඳහන් වේ.

පාලි අටුවාවල ථෙරවාදී බෝධිසත්ත්ව සංකල්පය ජනප්‍රිය වීමත් සමග ගෞතම බෝධිසත්ත්වයන්ගේ පාරමී පූර්ණය නිධාන 03ක් යටතේ විස්තර කරයි. එනම්,

1. දූරෙ නිදානය
2. අවිදූරෙ නිදානය
3. සන්තිකෙ නිදානය

මෙහිදී දීපංකර පාද මූලයේ සිට බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කොට තුසිත භවයේ උපත ලැබීම දක්වා කාලය දූරෙ නිදානය යි. තුසිත භවනයේ සිට දේවාරාධනයෙන් පසු පංච මහා විලෝකන බලා මිනිස් ලොවට පැමිණ සිදුහත් බෝසතුන් ගෞතම නමින් සම්බුද්ධත්වයට පැමිණීම දක්වා කාලය අවිදූරෙ නිදානය යි. සම්මා සම්බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා කාල සීමාව සන්තිකේ නිදානය යි.

උක්ත කරුණු අනුව රහත් භාවයට පවා හේතු සම්පත්ති තිබියදී අනුන් උදෙසා සසරට පිවිසෙන බෝධිසත්ත්වයෙකු බුද්ධත්වය උදෙසා සම්පූර්ණ කළ යුතු පාරමිතා දහයක් පිළිබඳ ථෙරවාද මූලාශ්‍රය තුළ දක්නට ඇත. එනම්,

1. දාන

2. සීල
3. නෙක්ඛම්ම
4. පඤ්ඤා
5. විරිය
6. ඛන්ති
7. සච්ච
8. අධිට්ඨාන
9. මෛත්‍රී
10. උපේක්ඛා

ගෞතම බුදුරදුන්ගේ මෙම පාරමිතා පූර්ණය පිළිබඳ තොරතුරු ජාතක ප්‍රවෘත්ති වශයෙන් චරියාපිටක පාළියේ විස්තර කරයි. එසේම ජාතක පාළියේ සහ ඊට අනුබද්ධ ජාතකට්ඨකතාවේ මෙන්ම ජාතක පොතේදී ද පෙර භවයන්හි දී සිදුහත් බෝසත් තෙමේ පුරන ලද පාරමිතා පිළිබඳ කරුණු දක්නට ඇත. බුද්ධවංසපාළියේ රත්නචංක්‍රමණ ඛාණ්ඩයේ බුදුරජාණන් වහන්සේගෙන් සැරියුත් හිමියන් විසින් පාරමිතා පිළිබඳ ප්‍රශ්න කරනු ලබන ආකාරය දක්නට ඇති අතර එහිදී උන්වහන්සේ මෙම පාරමිතා කෙබඳු ආකාරයෙන් සම්පූර්ණ කරන්නේ දැයි විමසයි.

*''දසපාරමී තයා ධීර - කීදිසා ලොකනායක*

*කථං උපපාරමී පුණ්ණා - පරමත්ථපාරමී කථං''*[21]

''ලෝකනාථයන් වහන්ස, ඔබ වහන්සේ විසින් කෙබඳු දස පාරමී පුරණ ලද ද? කෙබඳු දස උපපාරමී පුරණ ලද ද? කෙබඳු දසපරමත්ථ පාරමී පුරණ ලද ද?''

මෙම විමසුමට අනුව ඉහත දැක්වූ පාරමිතා ධර්ම,

1. පාරමී
2. උප පාරමී
3. පරමත්ථ පාරමී

යනුවෙන් තෙවැදෑරුම් ආකාරයෙන් බුද්ධත්වය අපේක්ෂා කරන බෝධිසත්ත්වයෙකු විසින් සම්පූර්ණ කළ යුතු බව සඳහන් වේ.

මෙම කරුණු අනුව ථෙරවාදී මූලාශ්‍රය තුළ දක්නට ලැබෙන්නේ මානුෂීය ලක්ෂණයන්ගෙන් හෙබි බෝධිසත්ත්ව සංකල්පයක් පිළිබඳව ය. විශේෂයෙන් ඛුද්දක නිකායට අයත් ජාතකපාලියෙහි කථා ඇසුරු කොටගෙන රචනා වී ඇති ජාතකට්ඨකතාව සහ එහි සිංහල අනුවාදය ලෙස සැළකෙන ජාතක කතා පොතෙහි දැක්වෙන කරුණු අනුව උක්ත අදහස මනාව දැකගත හැක. ජාතක කතා පොතෙහි නිරූපණය බෝධිසත්ත්ව චරිතය සෑම විටම සාධු චරිතයක් හෝ අපිස් චරිතයක් නොවේ. එහිදී බෝසත් චරිතය තුළින් ද මානුෂීය ලක්ෂණ ඉස්මතු වන ආකාරය දැකගත හැකිය.

චුල්ලපලෝභන ජාතකයේ බෝසත් අසනග කුමාරයා ළදරු කාලයේ පටන් ගැහැණුන් ප්‍රිය කරන්නෙක් නොවීය. ඔහු මවගෙන් කිරි බීවේ ද ඇගේ මුහුණ තිරයකින් වසා එහි සිදුරකින් තන පුඩුව දුන් විට පමණි. අනතුරුව හුදෙකලාව මාලිගාවේ සිටින කමරුට නළගනන්ගේ ගීත නාදය ඇසීමට අවස්ථාව හිමි වෙයි. එයින් පිබිදුණු කාමය ඇති කුමරු ඔවුන්ගේ පහස විඳ පුපුරා ගිය කාම ගින්නෙන් පෙළීමට පත්ව කඩුව ගෙන වීදියට බැස අනෙකුත් සියලු පිරිමි මරා දැම්මේ ය.[22] බෝධිසත්වයෙකු වුව ද අසනග කුමරු රාගයෙන් වියරු වැටුනේ ඔහු කෙලෙසුන් සහිත පෘථග්ජනයෙකු වූ හෙයිනි.

සතපත්ත ජාතකයෙහි වැඩිවිය පැමිණි බෝසත් කුමරු සොරුන්ගේ නායකයා වී මං පැහැරීමෙන් ජීවත් වූයේ ය. කක්කට ජාතකයේ එන බෝසත් ඇතු රන් කකුළුවෙකුගෙන් ඇතුන්ට සිදු වූ පීඩාව නැති කිරීමට සිතා බෝසත් ඇතු කකුළුවා පයින් පාගා මරා දැමීය. උම්මග්ග ජාතකයේ බෝසත් මහෞෂධ පඬිතුමා වේදේහ රජුගේ පුරෝහිතයා ය. ඔහු මහළු කේවට්ට බමුණාගේ නිකට ලේ ගලන තෙක් බිම උලයි. සේනාවට සුරා බොන්නට දෙයි. වෙනත් රජෙකුගේ ඉතා බාල වියෙහි වූ කුමාරියක උපායෙන් ගෙන ගොස් මහළු වේදේහ රජුට විවාහ කරදෙයි. උපායෙන් සහ වංචාවෙන් සතුරන් ජයගනී. එසේම කුද්දාල ජාතකයෙහි කුද්දාල බෝසත් පඬිතෙම උදලු කෙටිය කෙරෙහි බැඳුණා වූ ලෝභය නිසා පැවිදිව සය වතාවක් ගිහි වූයේ ය.

මේ ආදී වූ ජාතක කතා පිළිබඳ විමසා බැලීමේ දී එහි නිරූපණය වන බෝධිසත්ව චරිත මනුෂ්‍ය ජීවිතයට උරුම වූ දුර්වලකම්වලින් මෙන්ම හොඳ ගුණාංගවලින් ද යුතු චරිත ලෙස නිරූපනය කොට ඇති ආකාරය දැකගත හැක.

මෙසේ ථෙරවාදී පාලි සතර නිකායේ ඉතා සුළු වශයෙන් දක්වා ඇති බෝධිසත්ව සංකල්පය පසුකාලීනව බුද්ධවංශ, චරියාපිටක, ජාතකපාලි යන ඛුද්දක නිකායට අයත් මූලාශ්‍රය ග්‍රන්ථ මගින් සංවර්ධනය කොට ඇති ආකාරය දැකගත හැකිය. මෙහිදී ථෙරවාදීන් බෝධිසත්වයා යනු ද මානුෂීය ලක්‍ෂණ වලින් යුතු තැනැත්තෙකු ලෙස හුවා දැක්වීමට මහත් වූ ප්‍රයත්නයක් දරා ඇති බව පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


### ප්‍රාථමික මූලාශ්‍ර

1. ම.නි. අරියපරියෙසන සුත්ත
2. සං.නි. ගොතම සුත්ත
3. අං.නි. දුක නිපාතය
4. දී.නි. මහාපදාන සුත්ත
5. බුද්ධ වංශය, සුමේධ කථා

### ද්විතික මූලාශ්‍ර

1. ධම්මතිලක හිමි, පැලැන්වත්තේ. බෝධිසත්ත්ව සංකල්පව, 2008. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
2. අබේකෝන්, ලොකුබණ්ඩාර, ඒ. එම්, (2002) ථෙරවාදී බුදුසමය සහ මහායාන බුදුසමය, අභය මුද්‍රණ.
3. උපාධ්‍යාය, බලදේව, (1996) බෞද්ධ දර්ශනය (පරි), පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, ඇස් ගොඩගේ, කොළඹ.
4. අරියවිමල හිමි, කොස්වත්තේ, උසස් පෙළ බුද්ධ ධර්මය, 1996, සමයවර්ධන
5. නිවන් මග, මහායාන කලාපය, රජයේ මුද්‍රණාලය
6. නිවන් මග, බුද්ධ චරිතය, රජයේ මුද්‍රණාලය
7. ඥානසුමන හිමි, දෙල්දූවේ, (2004) මධ්‍යකාලීන බුදු සමයේ මූලික කරුණු, ඇස්. ගොඩගේ.
8. භාරතීය දර්ශනය, (පරි) පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (1999) ඇස්. ගොඩගේ.
9. රත්නගොඩ, ලසන්ත, (2003) සමයාන්තර ධර්ම සහ ථෙරවාදී මහායාන මූලධර්ම, ආරිය ප්‍රකාශන.
10. සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායාන අදහස්
11. විමලඥාන හිමි, නාඹටුන්නේ, බෝධිසත්ත්ව සංකල්පය, ලිපිය

[1] නිවන් මග, මහායාන කලාපය, 23 පිටුව, ඇකිරියගල නන්ද හිමි, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

[2] පපංචසූදනී, භයභෙරව සුත්ත බු:ව:, 2550, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

[3] බෝධිචරියා පංචිකා, 421 පිටුව.

[4] මජ්ඣිම නිකායට්ඨකතා, භයභෙරව සුත්තවණ්ණනා, 103 පිටුව.

[5]ජාතක අටුවා ගැටපදය, 18 පිටුව.

[6] HAR DAYAL, Bodisatta Doctrine

[7] HAR DAYAL, THE BODISATTA DOCTRINE, P. 214

[8] බෝධිසත්ව සංකල්පය, ආචාර්ය පැලවත්තේ ධම්මතිලක හිමි, 2 පරිච්ඡේදය, 21 පිටුව.

[9] ම.නි. අරියපරියෙසන සුත්ත, බුඃවඃ, 2550. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

[10] සං.නි. ගොතම සුත්ත, බුඃවඃ, 2550. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

[11] අං.නි. දුක නිපාතය බුඃවඃ, 2550. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

[12] දී. නි. මහාපදාන සුත්ත බුඃවඃ, 2550. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

[13] දී.නි. මහාපදාන සුත්ත, බුඃවඃ, 2550. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

[14] බෝධිසත්ව සංකල්පය, ආචාර්ය පැලවත්තේ ධම්මතිලක හිමි, 2 පරිච්ඡේදය, 22 පිටුව.

[15] නිවන් මග, මහායාන කලාපය, 24 පිටුව, ඇකිරියගල නන්ද හිමි. රාජ්‍ය මුද්‍රණ සංස්ථාව,

[16] බුද්ධ වංශය, සුමේධ කථා, 60 ගාථාව, 30 පිටුව, බු.ජ.මු.

[17] එම, 58 ගාථාව, එම

[18] නිවන් මග, මහායාන කලාපය, 25 පිටුව, ඇකිරියල නන්ද හිමි, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව,

[19] බුද්ධ වංශය, සුමේධ කථා, 70 ගාථාව, 30 පිටුව, බු.ජ.මු.

[20] නිවන් මග, මහායාන කලාපය, 25 පිටුව, ඇකිරියගල නන්ද හිමි, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව,

[21] බුද්ධ වංශය, රතනචංකමන කාණ්ඩය, 77 ගාථාව

[22] වේරගොඩ අමරමෝලි හිමි, පන්සියපනස් ජාතක පොත, චුල්ලපලහෙන ජාතකය.